ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය 2014.03.21

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 මාර්තු

2013 වසරේ දී ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහි පුළුල් වර්ධනයත් සමග සිදු වූ දළ දේශීය නිෂ්පාදිතයෙහි ඉහළ යාම ශ්‍රී ලංකා ආර්ථිකයේ ශක්තිමත් වර්ධන හැකියාව නැවත වරක් අවධාරණය කරන ලදී. පහළ සහ ස්ථාවර උද්ධමනය මගින් පෝෂණය වූ ආර්ථිකය, 2012 වසරේ සියයට 6.3 වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 7.3 කින් වර්ධනය වෙමින්, ඉහළ තිරසාර වර්ධන මාවතකට අවතීර්ණ වීම පිළිබඳව සංඥා කරන ලදී.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මෑතක දී නිකුත් කළ දත්තයන්ට අනුව, 2013 වසරේ අවසාන කාර්තුව තුළ සේවා අංශයේ වර්ධනයෙහි යම් අඩුවීමක් පෙන්නුම් කළ ද, කෘෂිකාර්මික හා කාර්මික අංශයන්ගේ සිදු වූ ඉහළ වර්ධනය පෙන්නුම් කරමින් ද.දේ.නි. සියයට 8.2 ක වර්ධනයක් වාර්තා කිරීමට සමත් විය. වසර තුළ දී කාර්මික අංශය සියයට 9.9 ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර කෘෂිකාර්මික හා සේවා අංශයන් පිළිවෙලින් සියයට 4.7 ක සහ සියයට 6.4 ක වර්ධන වේගයක් පෙන්නුම් කරන ලදී. වසර තුළ දැකිය හැකි වූ පාරිභෝගික මිල උද්ධමනයේ පහළ යාම සනාථ කරමින් ද.දේ.නි. අවධමනකය 2012 වසරේ පැවති සියයට 8.9 සිට 2013 වසර සඳහා සියයට 6.7 දක්වා පහළ ගියේය.

ආර්ථිකයේ පවත්නා සමස්ත ඉල්ලුම් තත්ත්වයන් සහ බොහෝ ආහාර ද්‍රව්‍යයන්ගේ දේශීය සැපයුම ඉහළ යාම පිළිබිඹු කරමින් පාරිභෝගික මිල උද්ධමනය 2014 පෙබරවාරි මාසයේ දී අඛණ්ඩව 61 වන මාසයටත් මැදි තනි අංකයක පැවතුණි. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය, පිළිවෙලින්, 2014 ජනවාරි මස පැවති සියයට 4.4 සහ සියයට 3.5 ට සාපේක්ෂව පෙබරවාරි මාසයේ දී සියයට 4.2 සහ සියයට 3.1 දක්වා අඩු විය. ඉදිරි කාලය සැලකීමේ දී 2014 වසර මුළුල්ලේ ම උද්ධමනය මැදි තනි අංකයක පවතිනු ඇතැයි

අපේක්ෂා කෙරේ. ඉදිරි කාලයේදී උද්ධමනය සඳහා ඉල්ලුම් සාධකයන් හිතකර වුවද, රටේ ඇතැම් ප්‍රදේශවල පැවති නියඟ තත්ත්වයන් හේතුවෙන් සැපයුමට ඇතිවිය හැකි බාධාවන් පිළිබඳව මහ බැංකුව වඩාත් සමීපව අධීක්ෂණය කරනු ඇත.

විදේශීය අංශය සැලකූ විට, 2013 ජූනි මාසයේ ඇරඹුණු වර්ධන ගම්‍යතාවය තවදුරටත් පවත්වාගෙන යමින්, 2014 ජනවාරි මාසය තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන ආදායම සියයට 23.2 කින් වර්ධනය විය. මෙම මාසය තුළ ආනයන වියදම සියයට 7.9 කින් ඉහළ ගියේය. අපනයන යථා තත්ත්වයට පත්වීම සහ ආනයන වර්ධනයේ සිදු වූ අඩුවීම පිළිබිඹු කරමින් 2014 ජනවාරි මාසය තුළ දී වෙළෙඳ හිඟය එ.ජ. ඩොලර් මිලියන 756 දක්වා සියයට 5.9 කින් අඩු විය. සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් 2014 ජනවාරි මාසය තුළ හිතකර වර්ධනයක් වාර්තා කළ අතර සංචාරක අංශයේ ඉපැයීම් 2014 පළමු මාස 2 තුළ දී ඉහළ වර්ධන ගම්‍යතාවයක් පෙන්නුම් කළේය. තවද, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම්, තක්සේරු ලාභ හා ජනවාරි මාසයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවේ ලැබීම් හේතුකොටගෙන දළ නිල සංචිත, 2014 ජනවාරි අවසාන වනවිට ආනයනික මාස 5.3 කට සමාන වෙමින් එ.ජ. ඩොලර් බිලියන 8.0 ක් දක්වා වර්ධනය විය.

මුදල් අංශයෙහි, පෞද්ගලික අංශය හා රාජ්‍ය සංස්ථාවලට ලබාදුන් ණය ප්‍රමාණය අඩු වූ නමුත්, රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ යාම මූලික වශයෙන් හේතුකොටගෙන පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2014 ජනවාරි මාසයේ දී සියයට 16 කින් වර්ධනය විය. 2014 ජනවාරි මාසය තුළ බැංකු පද්ධතිය මගින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 68.3 කින් පමණ ඉහළ ගිය නමුත් සෛවරීත්ව බැඳුම්කරයේ ලැබීම් භාවිතා කිරීමත් සමග රජය වෙත ලබාදුන් ශුද්ධ ණය ප්‍රමාණය පෙබරවාරි මාසය තුළ අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් ම මාසය තුළ දී පෞද්ගලික අංශය විසින් කෙටිකාලීන අත්තිකාරම් පියවීම මෙන් ම උකස් ණය හා විදේශ වෙළෙඳාම ආශ්‍රිත ණයෙහි සිදු වූ පහළ යාම හේතුකොටගෙන වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වර්ධනය, 2013 දෙසැම්බර් මාසයේ පැවති සියයට 7.5 ට සාපේක්ෂව 2014 ජනවාරි මාසයේ දී වර්ධනය වූයේ සියයට 5.2 කින් පමණි. කෙසේ වුවත්, පෞද්ගලික අංශයේ සිදු වූ මෙම ණය වර්ධනයෙහි පහළ යාම තාවකාලික බව මුදල් මණ්ඩලයේ මතය වන අතර, පහළ යන වෙළෙඳපොළ ණය පොලී අනුපාතික, ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් හා දියුණු ආර්ථිකයන් මගින් අපනයන සඳහා වන ඉල්ලුම ඉහළ යාම හේතුකොටගෙන වසරේ දෙවන කාර්තුවේ සිට ඉදිරියට පෞද්ගලික අංශයේ ණය වර්ධනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2014 මාර්තු මස 20 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සුදුසු යැයි මුදල් මණ්ඩලයෙහි මතය වූ අතර, ඒ අනුව මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙලින් සියයට 6.50 ක් සහ සියයට 8.00 ක් ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.